**Improving the business environment in Sri Lanka_ It's not so difficult – Published on 24.12.2014 – Mawbima (Sinhala)**

E paper - http://www.mawbima.lk/e-paper.html

Web page - http://www.mawbima.lk/83-75245-news-detail.html



# පහසුවෙන් දියුණු කළ හැකි ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික පරිසරය

ප්‍රදර්ශිතය 01 - කාන්දුවීම වළක්වා ගැනීම

| දර්ශක ශ්‍රේණිය | 2014 | 2015 | වෙනස |
|---|---|---|---|
| ව්‍යාපාර පවත්වාගෙන යෑමේ දර්ශකය | 105 | 99 | 6 |
| ව්‍යාපාරයක් ඇරඹීම | 101 | 104 | -3 |
| ඉදිකිරීම් බලපත්‍ර | 60 | 60 | 0 |
| විදුලිය ලබාගැනීම | 100 | 100 | 0 |
| දේපළ ලියාපදිංචි කිරීම | 124 | 131 | -7 |
| ණය ගැනීම | 86 | 89 | -3 |
| සුළු පරිමාණ ආයෝජකයන් රැකගැනීම | 50 | 51 | -1 |
| බදු ගෙවීම | 167 | 158 | 9 |
| දේශසීමාවන් හරහා වෙළෙඳාම් කිරීම | 85 | 69 | 16 |
| ගිවිසුම් බලාත්මක කිරීම | 165 | 165 | 0 |
| බුන්වත්වීම විසඳීම | 68 | 72 | -4 |

මූලාශ්‍රය - ව්‍යාපාර පවත්වාගෙන යෑමේ දර්ශකය (DBI)

ප්‍රදර්ශිතය 02 - ගිවිසුම් බලාත්මක කිරීම, බදු ගෙවීම සහ දේපළ ලියාපදිංචි කිරීම වෙත අවධානය යොමු කරන්න.




මූලාශ්‍රය : ව්‍යාපාර පවත්වාගෙන යෑමේ දර්ශකය (DBI)

ප්‍රදර්ශිතය 03 : දුබලතම පුරුක - ගිවිසුම් බලාත්මක කිරීම.




මූලාශ්‍රය : ව්‍යාපාර පවත්වාගෙන යෑමේ දර්ශකය (DBI)

VERITÉ RESEARCH
Strategic Analysis for Asia

## 02 >> පහසුවෙන් දියුණු කළ හැකි ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික පරිසරය

මගින් ආයෝජකයන් දෙගිඩියාවට පත්වීම පසුගාමී වීමට ඉඩකඩ පවතින බැවිණි. ගිවිසුම් බලාත්මක කිරීම සම්බන්ධව දක්වන පසුගාමී බව දර්ශකයෙහි අනෙකුත් අංශ කෙරෙහිද බලපෑමක් සිදුකළ හැකිය. (ණය පහසුකම් ලබාගැනීම සහ ඹුන්වත්භාවයන් බේරුම් කිරීම වැනි අංශ). ශ්‍රී ලංකාවේ නෛතික ප්‍රතිසංස්කරණයන් සිදුකිරීම පහසුවෙන් හා ඉක්මනින් කළ හැකි කටයුත්තක් නොවූවද එය ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික පරිසරය දියුණු කිරීම සඳහා අත්‍යවශ්‍ය මෙන්ම තීරණාත්මක සාධකයක් ලෙස බලපායි. මෙම අංශය තුළ සිදුකරන ප්‍රතිසංස්කරණ මගින් විස්මයජනක ප්‍රතිඵල ළඟාකර ගත හැකිය. උදාහරණයක් ලෙස ගිවිසුම් බලාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකාව තුළ දැනට දින 1318ක පමණ කාලයක් ගතවන අතර එය ආසියා ශාන්තිකර කලාපයේ සාමාන්‍ය වන දින 553ක් දක්වා අඩුකර ගත හැකි නම් දර්ශකය තුළ ශ්‍රී ලංකාවේ ශ්‍රේණිය ස්ථාන 15කින් පමණ ඉදිරියට ගෙන ආ හැකිවේ. එමගින් දර්ශකයෙහි අනෙකුත් උප අංශයන් වර්ධනය කර ගැනීමටද උත්තේජනය සැපයේ.

**ශ්‍රේණිගත කිරීමේ ඉහළින්ම සිටිනා රටවල් 10 අතරට පැමිණීම සඳහා වන ප්‍රමුඛතාවන් ත්‍රිත්වය**

මෙම විශ්ලේෂණය මගින් ශ්‍රී ලංකාවට ව්‍යාපාර පවත්වාගෙන යෑම පිළිබඳ දර්ශකය තුළ ආසියා පැසිෆික් කලාපයේ ශ්‍රේණිගත කිරීමේ ඉහළින්ම සිටිනා රටවල් 10 අතරට පැමිණීම සඳහා අනුගමනය කළ යුතු වන පලදායී පියවර තුනක් හඳුන්වා දී තිබේ. මෙම පියවර තුනෙහි එක් අංශය මගින් වර්ධනය කිරීමෙන් පවා විස්මයජනක ප්‍රතිඵල ලබා ගත හැකිය. එනම් (1) කාන්දුවීම් වැළැක්වීම යන පියවර තුළින් දේපළ ලියාපදිංචි කිරීමේ අපහසුතා අවම කිරීම, (2) පහසුවෙන් වර්ධනය කරගත හැකි අංශ කෙරෙහි අවධානය යොමු කිරීම යන පියවර තුළ 'බදු ගෙවීමේ සංඛ්‍යාතය වෙනස් කිරීම (3) වඩාත් දුර්වල අංශයන් කෙරෙහි අවධානය යොමු කිරීම යන පියවරට අනුව 'ගිවිසුම් බලාත්මක කිරීමේදී නෛතික ක්‍රමය වඩාත් ඉක්මනින් ක්‍රියාත්මක වන ලෙසට ක්‍රමවේදයන් සැකසීම' දැක්විය හැකිය.